# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1794/20 - 2013 ජනවාරි 23 වැනි බදාදා - 2013.01.23**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය : IR/11/02/2005.

### කාර්මික ආරාවුල් පනත 131 වැනි අධිකාරිය

131 වැනි අධිකාරියවන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2012.06.15 වැනි දිනැති හා අංක 1762/43 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශේෂ ගැසට්* පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2012.06.11 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් කොළඹ 03, 22 වැනි පටුමඟ, අංක 03 හි පිහිටි ලංකා වෙළඳ කාර්මික සහ පොදු කම්කරු සංගමය (CMU) හා අනෙක් පාර්ශවය වශයෙන් කොළඹ, තැ.පෙ. 141 හි පිහිටි සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, කොළඹ 15, ශ්‍රීමත් රාමනාදන් මාවත, අංක 256, සෙට්මිල් මාරිටයිම් සෙන්ටර්, 2 වන මහල හි පිහිටි ඉන්ටර් ඔරියන්ට් ලොජිස්ටික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2012.12.21 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

වී. බී. පී. කේ. වීරසිංහ,
කම්කරු කොමසාරිස්.

2013 ජනවාරි මස 11 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

### කාර්මික අධිකරණයේ දී ය

ලංකා වෙළඳ කාර්මික සහ පොදු කම්කරු සංගමය (CMU),
අංක 03, 22 වැනි පටුමඟ,
කොළඹ 03.

පළමු පාර්ශවය .............

නඩු අංකය : A - 3459

සහ

1. සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
   තැ.පෙ. 141, කොළඹ

සහ

2. ඉන්ටර් ඔරියන්ට් ලොජිස්ටික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
   2 වන මහල,
   සෙට්මිල් මාරිටයිම් සෙන්ටර්,
   අංක 256, ශ්‍රීමත් රාමනාදන් මාවත,
   කොළඹ 15.

*දෙවන පාර්ශවය* .............

අතර පවත්නා කාර්මික ආරාවුල සම්බන්ධ

### ප්‍රදානය

වැඩබලන කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ජගත් බාලසූරිය මහතා විසින් වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වැනි වගන්තියෙන් ගරු කම්කරු හා කම්කරු සබඳතා ඇමතිතුමාට පැවරී ඇති බලතල අනුව උක්ත ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරුවෙකු වශයෙන් 2012.06.11 දිනැති නියෝගයෙන් මා පත් කොට මා වෙත යොමු කර ඇත. කෙසේ වෙතත් මෙහි දී සඳහන් කළ යුතු උචිත කරුණක් වන්නේ ඉහත පාර්ශවයන් අතර පැවති 2006.10.20 වැනි දින කාර්මික ආරාවුල පිළිබඳ කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන

1 A – G 17186 — 350 (2013/01)

ලද කාරණය පිළිබඳව වූ කාර්මික ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් වී. අයි. ජයසූරිය මහතා වෙත යොමු කර ඇත. ඒ මහතා දැනට මිය ගොස් ඇති බැවින් වැඩබලන කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය එකී නියෝගය අවලංගු කර 2006.10.30 වැනි දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස වැඩිදුරටත් මා වෙත නියෝග කර ඇත.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ :-

"සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් එහි කොන්ත්‍රාත්කරු වන ඉන්ටර් ඔරියන්ට් ලොජිස්ටික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් මගින් සිය සමාගමේ සේවයෙහි යොදවා සිටි මෙයට අමුණා ඇති උපලේඛනයෙහි නම් සඳහන් ප්‍රයිම්මුවර් රියදුරුන් තිස් අටක (38) දෙනාට සේවයට වාර්තා කිරීමට ඉඩ නොදීම හේතුවෙන් ඔවුන්ට රැකියාව ලබා නොදීම යුක්තිසහගත ද යන්න හා යුක්තිසහගත නොවේ නම් ඔවුන් එකිනෙකාට කුමන සහනයක් හිමිද යන්න පිළිබඳව වේ."

***පෙනී සිටීම :***

මෙම නඩුවේ පළමු පාර්ශවය වෙනුවෙන් නියෝජිත ඊ. වී. එන්. කබ්රාල් මහතා පෙනී සිටින ලදී. දෙවන පාර්ශවයේ පළමුවන පාර්ශවකරු වෙනුවෙන් නීතිඥ විද්‍යා කමලසබේසම් මහත්මිය පෙනී සිටින ලදී. එම ආයතනය නියෝජනය කරමින් මානව සම්පත් සේවා කළමනාකරු චන්ද්‍රලාල් හික්කඩුව ලියනගේ මහතා පැමිණ සිටින ලදී. දෙවන පාර්ශවයේ දෙවන වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් නීතිඥ භූෂාන් ඉලේපෙරුම, නීතිඥ මංජු සිදම්බරම් සමග නීතිඥ ජෙෆ්රි අලගරත්නම් මහතා පෙනී සිටින ලදී. එම ආයතනය වෙනුවෙන් මානව සම්පත් සහ පරිපාලන කළමනාකරු පරසුරාමන් තිරුපදි ක්‍රිෂ්ණසාමි රාමක්‍රිෂ්ණා සහ පණ්ඩුක වීරසේකර (අධ්‍යක්ෂ) යන මහත්වරුන් පැමිණ සිටියහ.

මෙම නඩුව පළමු වතාවට 2012.07.16 වැනි දින කැඳවන ලදී. එදින මෙම නඩුවේ උපලේඛනයේ සඳහන් සේවකයින් 6 දෙනෙක් පමණක් පැමිණ සිටියහ. ඉන්පසු 2012.08.28 වැනි දින මෙම නඩුව කැඳවූ අවස්ථාවේ දී පාර්ශවකරුවන් විධිමත් ලෙස ඔවුන්ගේ පළමු ප්‍රකාශ ගොනු කර තිබුණි. එදින පළමු පාර්ශවයේ සේවකයින් විසි දෙදෙනෙක් (22) පැමිණ සිටි අතර එයින් සේවකයින් දෙදෙනෙකුගේ නම් මා වෙත ඉදිරිපත් කර ඇති උපලේඛනයේ සඳහන් නොවන බැවින් ඒ සම්බන්ධයෙන් සලකා බැලීමට මට බලතල නොමැත. ඒ අනුව මෙම සේවකයින් විසිදෙනා (20) හැර උපලේඛනයේ නම සඳහන් අනෙකුත් සේවකයින්ට මෙම සමථයට හිමිකම් නොමැත.

එදින මෙම නඩුව සමථයකට පත් කර ගැනීමට දෙපාර්ශවයටම මවිසින් උපදෙස් ලබා දෙන ලදී. අනතුරුව 2012.09.20 වැනි දින පළමු පාර්ශවය වන ලංකා වෙළඳ කාර්මික සහ පොදු කම්කරු සංගමය සහ දෙවන පාර්ශවයේ දෙවන පක්ෂය වන ඉන්ටර් ඔරියන්ට් ලොජිස්ටික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සේවා යෝජකයා බව පිළිගෙන ඇති බැවින් මෙම නඩුව සමථයකට පත් කර ගැනීමට එකඟතාවය පළකරන ලදී. එකී සමථය මත මෙම නඩුවේ දෙවන පාර්ශවයේ පළමු පාර්ශවය වන ගේට්වේ ටර්මිනල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් මෙම සමථයට අදාල නොවන බැවින් මෙම නඩුවෙන් නිදහස් කරන ලදී.

පළමු පාර්ශවකරු විසින් ඉදිරිපත් කර ඇති සේවකයින් 20 දෙනාට පමණක් එම සමථ කොන්දේසිවලට අදාල හිමිකම් ඇත. ඒ අනුව උපලේඛනයේ නම් සඳහන් අනෙක් සේවකයින්ට මෙම සමථයට අදාල හිමිකම් නොමැති බවට විවෘත උසාවියේ දී පළමු පාර්ශවකරු එකඟතාවය ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව දෙවන පාර්ශවයේ දෙවන පක්ෂය පහත පරිදි සමථ යෝජනාව ඉදිරිපත් කරන ලදී. එනම් :-

1. යම් සේවකයකු අවුරුදු 03 කට වැඩියෙන් සේවය කර තිබෙනවා නම් ඒ තැනැත්තාට සම්පූර්ණ හා අවසාන ගෙවීමක් වශයෙන් රු. 30,000 ක මුදලක් ලැබිය යුතු ය.
2. යම් සේවකයකු අවුරුදු 02 ට වැඩියෙන් හෝ අවුරුදු 03 ට අඩුවෙන් සේවය කර තිබෙනවා නම් ඒ තැනැත්තාට සම්පූර්ණ හා අවසාන ගෙවීමක් වශයෙන් රු. 20,000 ක මුදලක් ලැබිය යුතු ය.
3. යම් සේවකයකු අවුරුදු 01 ට වැඩියෙන් හෝ අවුරුදු 02 ට අඩුවෙන් සේවය කර තිබෙනවා නම් ඒ තැනැත්තාට සම්පූර්ණ හා අවසාන ගෙවීමක් වශයෙන් රු. 15,000 ක මුදලක් ලැබිය යුතු ය.
4. යම් සේවකයකු අවුරුදු 01 ට අඩුවෙන් සේවය කර තිබෙනවා නම් ඒ තැනැත්තාට සම්පූර්ණ හා අවසාන ගෙවීමක් වශයෙන් රු. 6,000 ක මුදලක් ලැබිය යුතු ය.
5. එසේම අදාල වෛද්‍ය අරමුදලට කපාගත් මුදල් සේවකයින්ට භාරදීමට දෙපාර්ශවය එකඟවන ලදී.
6. එසේම සේවකයාට දිය යුතු කිසියම් නීතීමය මුදලක් තිබේ නම් එය ගෙවිය යුතු බවටත් B කාඩ් හා ඒ සම්බන්ධව කටයුතු කළ යුතු බවටත් එකඟ විය.

ඉහත සඳහන් සමථ කොන්දේසි පළමු පාර්ශවකරු විසින් තේරුම්ගෙන විවෘත උසාවියේ දී එකඟතාවය එළ කරන ලදී.

ඉන්පසු 2012.12.05 වැනි දින දෙපාර්ශවය සමථයට සූදානම්ව පැමිණීමට එකඟ විය. එදින දෙවන පාර්ශවයේ දෙවන පක්ෂය :

Table 1 Dues payable by employees
Table 2 Final Dues receivable by employees
Table 3 Ex-gratia payment as full and final settlement
Table 4 All embracing comprehensive payment schedue
යන ලේඛන සමග සමථයට සූදානම්ව පැමිණ සිටියහ. එසේම ඉහත සඳහන් ලේඛනවල පිටපත් විවෘත උසාවියේ දී ගොනු කරන ලදී. නමුත් පළමු පාර්ශවයේ සේවකයින් 11 දෙනෙක් පමණක් පැමිණ සිටි නිසා සම්පූර්ණ හා අවසාන ගෙවීම විවෘත උසාවියේ දී සිදු කිරීමට එදින නොහැකි විය.

ඒ නිසා 2012.12.12 සහ 2012.12.14 වැනි දින පෙ.ව. 10.00 සිට 12.00 දක්වා දෙවන පාර්ශවයේ දෙවන පක්ෂය වන ඉන්ටර් ඔරියන්ට් ලොජිස්ටික් කාර්යාලයට පැමිණ මෙම සමථය සම්පූර්ණ කර ගැනීමට අවස්ථාව ලබා දෙන ලදී.

අනතුරුව 2012.12.18 වැනි දින සම්පූර්ණ විස්තරාත්මක ලියකියවිලි ලේඛකාධිකාරි වෙත භාර දී ඇත. එකී සමථය අනුව,

Table 1 Dues payable by employees
Table 2 Final Dues receivable by employees
Table 3 Ex-gratia payment as full and final settlement
Table 4 All embracing comprehensive payment schedue
යන ලේඛන භාර දී ඇත.

TABLE - 04

(Qualified for Exgratia Payment - without Prefudice to Our Rights

SCHEDULE FOR SETTLEMENT ON LCASE No. A 3459

| SL/ No. | Name of Employee | Emp No. | D. O. J. | Last Worked | Cont. to Exipire on | Last Salary Drawn | Preriod Served | Exgratia Payment | Salary Balance | Total Payable | Ad. Paid | Festival Advance | Total Deduction | Medical Fund Balance | Payment Due | Final Payment | Signature |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | J. B. Harischandra | 12 | 04.08.2003 | 30.09.2005 | 31.08.2006 | 3850 | 2Y 3M 26D | 20,000 | 205 | 20,205 | - | 2,500 | 2,500 | 5,750 | 3,455 | 23,455 | Signed |
| 2 | W. D. J. P. Kumara | 23 | 30.05.2003 | 30.09.2005 | 30.06.2006 | 4125 | 2Y 4M | 20,000 | 219 | 20,219 | - | 2,500 | 2,500 | 5,750 | 3,469 | 23,469 | - |
| 3 | R. M. K. Gunawardhara | 70 | 30.05.2003 | 30.09.2005 | 30.06.2006 | 4125 | 2Y 4M | 20,000 | 96 | 20,096 | - | 2,500 | 2,500 | 5,750 | 3,346 | 23,346 | - |
| 4 | M. A. Karunasena | 109 | 04.06.2003 | 30.09.2005 | 30.06.2006 | 3500 | 2Y 3M | 20,000 | 186 | 20,186 | - | 2,500 | 2,500 | 5,750 | 3,436 | 23,436 | - |
| 5 | H. K. C. Sanara | 146 | 01.10.2003 | 30.09.2005 | 04.09.2006 | 3500 | 1Y 11M 29D | 20,000 | 186 | 20,186 | - | 2,500 | 2,500 | 4,000 | 1,686 | 21,686 | - |
| 6 | P. G. W. Jayalath | 152 | 20.10.2003 | 30.09.2005 | 19.10.2006 | 3850 | 1Y 11M 10D | 15,000 | 205 | 15,205 | - | 2,500 | 2,500 | 5,250 | 2,955 | 17,955 | - |
| 7 | W. D. I. Livera | 163 | 01.06.2004 | 30.09.2005 | 30.05.2006 | 3500 | 1Y 4M | 15,000 | 186 | 15,186 | - | 2,500 | 2,500 | 4,625 | 2,311 | 17,311 | - |
| 8 | R. M. N. Ranjith | 194 | 14.05.2004 | 30.09.2005 | 13.05.2006 | 3500 | 1Y 4M 20D | 15,000 | 186 | 15,186 | - | 2,500 | 2,500 | 4,250 | 1,936 | 16,936 | - |
| 9 | D. S. K. Weerasinghe | 218 | 10.07.2004 | 30.09.2005 | 08.06.2006 | 3500 | 1Y 2M 28D | 15,000 | 186 | 15,186 | - | 2,500 | 2,500 | 3,750 | 1,436 | 16,436 | - |
| 10 | M. K. G. S. Gamini Bandara | 237 | 02.08.2004 | 30.09.2005 | 01.08.2005 | 3500 | 1Y 1M 28D | 15,000 | 186 | 15,186 | - | 2,500 | 2,500 | 3,500 | 1,186 | 16,186 | - |
| 11 | B. W. M. Gamini | 236 | 03.08.2004 | 10.03.2005 | 02.08.2006 | 3500 | 7M 7D | 6,000 | - | 6,000 | - | - | - | - | - | 6,000 | - |
| 12 | M. R. M. N. Bandara | 59 | 04.06.2003 | 06.04.2005 | 30.08.2006 | 3850 | 1Y 10M 02D | 15,000 | 0 | 15,000 | 3,050 | - | 3,050 | 4,500 | 1,450 | 16,450 | - |
| 13 | P. S. Colos | 174 | 14.05.2004 | 25.04.2005 | 13.05.2006 | 3500 | 11M 11D | 6,000 | 5 | 6,005 | - | 2,075 | 2,075 | - | 2,071 | 3,930 | - |
| 14 | L. G. P. Premasiri | 164 | 01.06.2004 | 05.04.2005 | 30.06.2006 | 3500 | 10M 04D | 6,000 | - | 6,000 | - | 4,000 | 4,000 | 2,875 | 1,125 | 4,875 | - |
| 15 | P. R. G. Thilakarathne | 46 | 04.06.2003 | 30.04.2005 | 30.03.2006 | 4125 | 1Y 10M 26D | 15,000 | - | 15,000 | 2,125 | - | 2,125 | 4,500 | 2,375 | 17,375 | - |
| 16 | B. Ajith Wasantha | 106 | 30.05.2003 | 05.04.2005 | 30.06.2006 | 3850 | 1Y 10M 05D | 15,000 | - | 15,000 | - | - | - | 4,000 | 400 | 19,000 | - |
| 17 | G. D. Silva | 96 | 17.06.2003 | 15.07.2005 | 30.06.2006 | 4125 | 2Y 28D | 20,000 | - | 20,000 | - | - | - | 5,250 | 5,250 | 25,250 | - |
| 18 | W. Ekanayake | 143 | 01.10.2003 | 15.10.2005 | 30.09.2006 | 3850 | 2Y 14D | 20,000 | 32 | 20,032 | 650 | 4,000 | 4,650 | 4,500 | 118 | 19,882 | - |
| 19 | U. L. Wimalaratne | 135 | 18.09.2003 | 02.04.2005 | 30.08.2006 | 3850 | 1Y 6M 14D | 15,000 | - | 15,000 | - | - | - | 3,275 | 3,275 | 18,275 | - |
| 20 | W. G. J. Bandara | 144 | 01.10.2003 | 15.07.2005 | 29.09.2006 | 3850 | 1Y 09M 14D | 15,000 | - | 15,000 | - | - | - | 4,750 | 4,750 | 19,750 | - |
| | Total | | | | | | | 308,000 | 1,878 | 309,878 | 5,825 | 35,075 | 40,030 | 82,025 | 46,030 | 351,003 | |

එසේම පළමු පාර්ශවයේ සේවකයන් මුදල් භාරගත් බවට කුවිතාන්සි අත්සන් කර භාර දී ඇත. ඒ අනුව මෙය සම්පූර්ණ හා අවසන් සමථයක් ලෙස පළමු පාර්ශවය වෙනුවෙන් නියෝජිත ඊ. වී. එන්. කබ්රාල් මහතා සහ දෙවන පාර්ශවයේ දෙවන පක්ෂය වෙනුවෙන් මානව සම්පත් සහ පරිපාලන කළමණාකරු පරසුරාමන් තිරුපදි ක්‍රිෂ්ණසාමි රාමක්‍රිෂ්ණා මහතා ගොනුවේ අත්සන් තබන ලදී.

ඒ අනුව මෙම නඩුව පළමු පාර්ශවය හා දෙවන පාර්ශවයේ දෙවන පාර්ශවකරු අතර සමථයකට පත් කරන ලදී. දෙවන පාර්ශවයේ පළමු පාර්ශවකරු මෙම නඩුවෙන් නිදහස් කරන ලදී.

මෙම ප්‍රදානය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බව මාගේ නිගමනය වේ.

ටී. ඊ. සාන්තරාජන්,
බේරුම්කරු.

2012 දෙසැම්බර් මස 21 වැනි දින,
කාර්මික අධිකරණයේ දී ය.

02-299

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.